


# "මහා ආහාර පොළ හා සංගීත සැදෑව"

## මහින්ද දිසානායක දිවුල්ගනේ

ප්‍රදේශවාසී ඔබ සැමට විනෝදය ලබාදෙන සංගීත සැදෑවකට වගේම ආහාර පොලකටද සහභාගී වී ප්‍රණීත ශ්‍රී ලාංකීය ආහාරවල කාලෙකින් රස බලන්නත්, ඒවා දු දරුවන්ට හිතවතුනට අරගෙන යන්නත් පුළුවනි. මෙවරත් ගිය වසරේ වගේම මේ උසස් කටයුත්ත කරන්න බටහිර වික්ටෝරියා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය සංවිධානය වී සිටිනවා ප්‍රදේශවාසී ඔබ සැමගේ ආධාරයෙන් උපකාරයෙන් මෙවරත් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන්නයි සූදානම.

ඉතා මෑතකදී අභිනවයෙන් ඉදිකෙරෙන පාරමිතා අප බෞද්ධ විහාරයේ ගොඩනැගිලි අරමුදල වෙනුවෙන් පැවැත්වෙන මෙම ආහාර පොළ සඳහා සහභාගී වීමෙන් මහඟු පිංකමකටද දායක වීමට ඔබට භාග්‍ය උදාවේ. අනෙක් කාරණය තමයි ගෙවන ඒකකාරී ජීවිත ක්‍රමයෙන් පොඩ්ඩක් වෙනස් වෙන්නත් එක්ක එදාට අපිත් එක්ක එකතුවෙන්න. හිතමිතුරන් හා කථාබහ කරන්න විනෝදවන්න එන්න. අපි වගේම එදාට අපේ දුවා දරුවනන් එකතුවෙලා කථාබස් කරයි. කාලෙකින් හම්බවෙන දවසක් වෙයි එදා. දෙමාපියන් විදියට ඒ ගැනත් හිතලා අපි සතුටු වෙමු. දරුවන්ගේ සතුට අපේත් සතුට නිසා. පුංචි කාලේ ඉඳලා මුණ ගැහැණු යහලු යෙහෙලියෝ මේ හමුවන්නේ කොච්චර කාලෙකින්ද. අපේ මේ මහා ආහාර පොළේ වාඩිවෙලා දරුපවුල් සමග හිතමිතුරන් එක්ක ආහාර ගන්න පුළුවන් විදියට පහසුකම් තියෙනවා.

වාහන නවතා තබන්න ඕනේ තරම් ඉඩකඩ තියෙනවා. ඔබට මතක ඇතිනේ ST Bernadette Community centre එක. Cooke Ave –North Sunshine වල තියෙන, මේක මහා ආහාර පොළක් විතරක් නෙවෙවේ ගීත ගායන කරන්න, නටන්න, වයන්න මේ කියන ඕනෑම කලාංගයක් ඉදිරිපත් කරන්නත් ඔබට හොඳ අවස්ථාවක් මෙය සංවිධානය කරගැනීමේ පහසුව සඳහා පොඩ්ඩක් කලින් ඒ ඔබ ඉදිරිපත් කරන කලා අංගය ගැන තොරතුරු සංවිධාන මණ්ඩලයට දක්වන්න අතපසු කරන්නත් එපා

මේ මහපොළ හා සංගීත සැදෑව තියෙන දවස තමයි 2015 පෙබරවාරි මාසේ 21 වෙනි සෙනසුරාද. මොනවා හරි යොදා ගන්න වැඩක් තියෙනවානම් දැන්ම මේ සඳහා වෙන් කරගන්න. උදේ 11.00 ඉඳලා රාත්‍රියේ 11 වෙනතුරු ගොඩක් කාලය තියෙනවා. උදේ ඉඳලා හවස්වෙනතුරු එන්න පුළුවනි. ඒ දවසම අපි එක්ක විනෝදයෙන් ගතකරන්න එන්න අපි ආරාධනා කරනවා ඔබට.

මේ මහා ආහාර පොළට ආවහම විවිධ ආහාර වර්ගවල රස බලන්න සාධාරණ මුදලකට මිලදී ගන්නත් පුළුවනි. කොත්තු,බුරියානි, ආප්ප ආදී ගොඩක් කෑම වර්ග ඔබේ හිතේ හැටියට ගන්න පුළුවනි. මේ ඔක්කොම කෑම ජාති අපේ ගෙවල්වල හදන්න කරදර වෙන්නත් ඕනෑම නෑ. හැබැයි අන්තිම මොහොතේ එන්න හඳන්න එපා කලින්ම ඇවිල්ලා ඉන්න බලන්න. හොඳට ඉඩකඩ තියෙන ශාලාවක් මේ ශාලාව.

ගිය වතාවේදි මතක ඇතිනේ ඔබට ඇතුල්වීම නොමිලේ. මේ වතාවේදිත් එහෙමමයි. හිතේ වෙන-සක් ඇති කරගන්න එපා. ඔයගොල්ල විතරක් නෙවේ ඔයාලගේ දු දරුවනුත් එක්කම එන්න. ජීවිතේ දවසකට හරි පුංචි වෙනසක් ඇති වෙයි. පුළුවන්නම් අසල්වාසී ඇසුරු කරණ යාළු මිත්‍රයනුත් එක්ක එන්න බලන්න. අපිටත් එය හොඳ සහයෝගයක් ඉදිකරන්න බලාපොරොත්තු අපේ රොක් බෑන්ක් පංසලේ ඉදිකිරීම් කටයුතු වලට මේ ඔබෙත් ලැබෙන ඩොලරයක් විශාල පුණ්‍යාධාරයක් වෙයි. රොක්බෑන්ක් පාරිමිතා පංසලෙන් විශාල ආගමික සාමාජික අධ්‍යාපනික කටයුතු රාශියක් ප්‍රදේශවාසී පිංවත් ඔබ සැම වෙනුවෙන් සිදුවෙන බව රහසක් නෙවේ.

මේ සංවිධානය කොට තිබෙන මහා ආහාර පොළ සඳහා ඔබටත් දායක වෙන්න ක්‍රම කීපයකුත් තියෙනවා. ආහාරදාමය සැපයීම මුදල් ආධාර. සකස්කළ ආහාර ලබාදීම, වෙළදකුටි ක්‍රමාධාර, ශ්‍රමදායකත්වය, ආදී වශයෙන් දිනය නැවත මතක් කරන්නම්

පෙබරවාරි 21 සෙනසුරාදා උදේ 11 සිට රාත්‍රී 11 දක්වා.
ස්ථානය ST Berídette Community Hall

මේ විශේෂ කටයුත්ත සඳහා ප්‍රදේශවාසී ඔබට කාරුණිකව ආරාධනා කරන්නේ බටහිර වික්ටෝරි යා ශ්‍රී ලංකා බෞද්ධ සංගමය

**විමසීම්**

**දනවංශ 0469403981**
**රෝහන -0416154313**
**බණ්ඩාරනායක -0425855621**
**මහින්ද දිසානායක දිවුල්ගනේ (Music Inquries)**

